// ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 243/43 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

**වි. ගොපල්ලව,**
ජනාධිපති වරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින.
**කොළඹ දී ය.**

**නියෝග**

1. මේ නියෝග හදිසි අවස්ථා (සතුන් අයාලේ යැවීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1958 අංක 29 දරන සත්ව පනතේ විධිවිධාන සහ ඒ පනතේ 35 වන වගන්තිය යටතේ සාදනු ලැබ 1962 අගෝස්තු 20 වන දින අංක 13,268 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග කුමක් වුවද මේ නියෝග බල පැවැත්විය යුතුය.

**I වන කොටස**

3. වගා කළ යම් පෞද්ගලික ඉඩමක අයිතිකරු හෝ පරිහරණය කරන්නා විසින් නැතහොත් ඒ අයිතිකරු හෝ පරිහරණය කරන්නා කෙරෙන් විධිමත් ලෙස බලය ලත් යම් තැනැත්තකු විසින් ඒ ඉඩමට අයාලේ යන යම් සතකු අල්ලා ගෙන බැඳ තැබීමත්—

(අ) අයාලය නිසා සිදු වූ ද නියම බලධරයා විසින් තක්සේරු කරනු ලැබුවා වූ ද යම් අලාභයක් වුවහොත් ඒ මුළු මුදල ; සහ

(ආ) අල්ලා ගනු ලැබීමෙන් පසු ඒ සතා නඩත්තු කිරීමෙහිලා නියම බලධරයා විසින් තක්සේරු කරනු ලැබූ පරිදි වූ සාධාරණ වියදම ;

ඒ සතා අයිතිකරු විසින් ඔහුට ගෙවන තෙක් හෝ මෙහි මතු විධිවිධාන සැලැස්වෙන ආකාරයෙන් නියම බලධරයා විසින් අයකොට ඔහුට ගෙවන තෙක් ඒ සතා රඳවා තැබීමත් නීත්‍යානුකූල වන්නේය.

4. 3 වන නියෝගය යටතේ තක්සේරු කරන ලද මුදලක් සතා අයිතිකරු විසින් ඉඩම අයිතිකරුට හෝ එය පරිහරණය කරන්නාට ගෙවිය යුතු යයි අණකොට පැය හතළිස් අටක් ඇතුළත එය ගෙවන ලෙස නියම බලධරයා විසින් අණ කළ යුතුය. ඒ මුදල ගෙවනු ලැබූ විට, අයිතිකරු වෙත ඒ සතා ආපසු භාර දිය යුතුය.

5. 3 වන නියෝගයේ සඳහන් මුදල ගෙවීම 4 වන නියෝගයේ ඒ ගෙවීම සඳහා නියමිත කාලය ඇතුළත සතා අයිතිකරු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, හෝ සතා අයිතිකරු නිශ්චය කොට දැනගත නොහැකි අවස්ථාවක, නියම බලධරයා විසින් ඒ සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම හෝ විකිණීමට සැලැස්වීම කළ යුතු ය. ඒ විකිණීමෙන් ලැබෙන මුදල් පහත දැක්වෙන ප්‍රමුඛතාවන් අනුව ගෙවිය යුතුය :—

(අ) 3 වන නියෝගය අනුව තක්සේරු කළ මුදල සතා අයාලේ ගිය ඉඩම අයිතිකරුට හෝ එය පරිහරණය කරන්නාට ;

(ආ) යම් ශේෂයක් වුවහොත්, එය, සතා අයිතිකරුට නැතහොත් ඒ සතා අයිතිකරු නිශ්චය කොට දැන ගත හැකි නොවූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලට,

101A—ඒ 24287—2,100 (76/12)

## II වන කොටස

6. මේ නියෝගවල I වන කොටසේ විධිවිධාන කුමක් වුවද, වගාකළ පෞද්ගලික යම් ඉඩමක අයිතිකරු හෝ එය පරිහරණය කරන්නා විසින් නැතහොත් ඒ අයිතිකරු හෝ පරිහරණය කරන්නා විසින් විධිමත් ලෙස බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් සතුන් නිදැල්ලේ ඒ ඉඩමට යාමට ඉඩ නොදෙන ලෙස ඒ සතුන් අයිතිකරුවන්ට අවවාද කෙරෙන දැන්වීමක් ඒ ඉඩමේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇතහොත්, ඒ ඉඩමට අයාලේ යන යම් සතකු ඔහු විසින් වෙඩි තැබීම හෝ අන් ලෙසකින් විනාශ කිරීම නීත්‍යානුකූල වන්නේය.

7. 6 වන නියෝගය යටතේ වෙඩි තබන ලද හෝ අන් ලෙසකින් විනාශ කරන ලද සෑම සතකුගේම අයිතිකරු විසින් සතාගේ මළකුණ ඉවත් කිරීමට හිමිකම් ලැබිය යුතු අතර එය ඉවත් කිරීමට හිමිකම් ලත් තැනැත්තා විසින් කිසිම හිමිකම් පෑමක් කරනු නොලැබුවහොත්, නියම බලධරයා විසින් මළකුණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය. ඒ විකිණීමෙන් ලත් මුදලින් නියම බලධරයා විසින් කරන ලද තක්සේරුව අනුව 6 වන නියෝගයේ සඳහන් ඉඩම අයිතිකරු හෝ එය පරිහරණය කරන්නා වෙත ගෙවිය යුතු මුදල අඩු කිරීමෙන් පසු, එහි ශේෂය ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතුය.

8. මේ නියෝගවල—

"පරිපාලන දිස්ත්‍රික්කය" යන්නෙන් (392 වන අධිකාරය වන) පරිපාලන දිස්ත්‍රික්ක පනතේ අර්ථය අනුව පරිපාලන දිස්ත්‍රික්කය අදහස් වේ ;

"සතා" යන්නෙන් ගවයෙක් හෝ මී හරකෙක් අදහස් වන අතර ඊට බැටළුවෙක්, එළුවෙක්, ඌරෙක් හෝ කුකුළු වර්ගයේ සතෙක් ඇතුළත් වේ ; එහෙත් වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥාපනතින් ආරක්ෂා කෙරෙන යම් සතෙක් ඊට ඇතුළත් නොවේ ;

"නියම බලධරයා" යන්නෙන් පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තෙක් අදහස් වේ ;

"අයිතිකරු" යන්න යම් සතෙකු සම්බන්ධයෙහි ලා ගත් කල්හි තත්කාලයෙහි ඒ සතා භාරව සිටින තැනැත්තා ඊට ඇතුළත් වේ ;

"අයිතිකරු හෝ පරිහරණය කරන්නා" යන්න යම් පෞද්ගලික ඉඩමක් සම්බන්ධයෙහි ලා ගත් කල්හි, යම් ලිඛිත නීතියක් යටතේ රජය විසින් හෝ වෙනුවෙන් නිකුත් කරන ලද නැතහොත් පිළියෙල කරන ලද අවසර පත්‍රයක ප්‍රදානයක නැතහොත් කවරාකාර වූ හෝ නාමයකින් හෝ නිල නාමයකින් වූ වෙන යම් සාධන පත්‍රයක බලය අනුව හෝ යටතේ ඒ ඉඩම සන්තකයට හෝ පරිහරණයට ගෙන සිටින යම් තැනැත්තෙක්, හෝ ඒ අයිතිකරුගේ හෝ පරිහරණය කරන්නාගේ නියමය අනුව හෝ යටතේ ක්‍රියා කරන වෙන යම් තැනැත්තෙක් ඊට ඇතුළත් වේ ;

"කුකුළු වර්ගයේ සත්තු" යන්නට ඇති කරන කුකුල්ලු, කළුකුම්, පාත්තයන් හෝ තාරාවෝ ඇතුළත් වෙති ; තවද

"පෞද්ගලික ඉඩම" යන්නට යම් ලිඛිත නීතියක් යටතේ රජය විසින් හෝ වෙනුවෙන් නිකුත් කරන ලද නැතහොත් පිළියෙල කරන ලද අවසර පත්‍රයක, ප්‍රදානයක නැතහොත් කවරාකාර වූ හෝ නාමයකින් හෝ නිල නාමයකින් වූ වෙන යම් සාධන පත්‍රයක බලය අනුව හෝ යටතේ යම් තැනැත්තකු විසින් සන්තකයට හෝ පරිහරණයට ගෙන ඇති යම් රජයේ ඉඩමක් ඇතුළත් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී